# රිටිගල සංස්කෘතික භූ දර්ශනය

ඩබ්.ඒ.එම්.සී.එම්. අධිපත්තු[1]

අරිට්ඨ පබ්බත නොහොත් රිටිගල ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් මානව ජනාවාස වූ ස්ථානයක් ලෙස හඳුනාගැනීමට හැකිය. මෙම පර්වතය උතුරුමැද පළාතේ මරදන්කඩවල හබරණ මාර්ගයේ පිහිටා ඇති මුහුදු මට්ටමේ සිට අඩි පන්සියයක් පමණ උසකින් යුක්ත ස්වාභාවික ජෛව විවිධත්වයෙන් යුක්ත වූ කඳු වැටියකි. මෙම අධ්‍යයනයේදී රිටිගල සංස්කෘතික භූ දර්ශනය සක්ස්වීමෙහිලා පාදක වූ කරුණු සම්බන්ධයෙන් සාහිත්‍යය මූලාශ්‍රය තොරතුරු හා පුරාවිද්‍යාත්මක සාධක පිළිබඳ අධ්‍යයනය කරමින් රිටිගල ආශ්‍රිත සංස්කෘතික භූ දර්ශනයෙහි කාලානුක්‍රමික සකස් වීම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම අරමුණු වේ. දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය ලෙස සාහිත්‍යය මූලාශ්‍රය භාවිතය හා ක්ෂේත්‍ර ගවේෂණය යන ක්‍රමවේද යොදාගත් අතර සම්මුඛ සාකච්ඡා ක්‍රමය ද පාදක කරගන්නා ලදි. ස්වාභාවික භූ දර්ශනය හා සංස්කෘතික භූ දර්ශනය ලෙස භූ දර්ශන පුරාවිද්‍යාවේ ප්‍රධාන කොටස් දෙකක් තිබේ. ඉන් සංස්කෘතික භූ දර්ශනය යනු මිනිසාගේ මැදිහත්වීම තුළින් නිර්මාණය කරන ලද තාවකාලික කඳවුරු, වාසස්ථාන ආදී ලෙස මිනිසුන් තම වටපිටාව නිර්මාණය කරගැනීමේදී ඇතිවන ලක්ෂණ වේ. රිටිගල සංස්කෘතික භූ දර්ශනය නිර්මාණය වීමෙහිලා ප්‍රාග් ඓතිහාසික යුගය, පූර්ව හා මුල් ඓතිහාසික යන යුගයන් හි මානව ක්‍රියාකාරිත්වය හේතු වී ඇති බව හඳුනාගත හැකිය. එහි දී ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා මෙම කඳුවැටිය ආශ්‍රිතව ඇති ලෙන් වාසස්ථාන ලෙස භාවිත කරමින් දඩයම්කරුවන් ලෙස භූමිය භාවිත කර ඇත. පසුව එළඹෙන පූර්ව ඓතිහාසික යුගයේ යකඩ තාක්ෂණය සමඟ මෙම භූමියෙහි සම්පත් ප්‍රයෝජනයට ගනිමින් ඔවුන්ගේ කටයුතු කරගැනීමට පෙළඹී ඇති බව මීට යාබදව ගලා බසින යාන්ඔය නිම්නයේ ජනාවාස රටාව අධ්‍යයනයේදී හඳුනාගත හැකිය. රිටිගල ආශ්‍රිත සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ ප්‍රබල සාධක හමුවන යුගය ලෙස මුල ඓතිහාසික හා ඓතිහාසික යුගය දැක්විය හැකිය. එහි දී මිනිසුන් ස්වාභාවික ගල් ගුහා ලෙන් ආරාම ලෙස සකස්කර භාවිත කිරීම, ජල මාර්ග හරස් කර පොකුණු හා කුඩා වැව් රිටිගල ආශ්‍රිතව නිර්මාණය කරගැනීම හා පසුකාලීනව පධානඝර ඉදිකිරිම කිරීම වැනි කරුණු මෙහි ස්වාභාවික භූ දර්ශනය සංස්කෘතික භූ දර්ශනයක් බවට පරිවර්ථනය වීම හඳුනාගත හැකිය. එසේම මෙහි ඇති රිටි වැනි උස ගස් හා වනයේ ඇති ගුප්ත බව හා කඳුවැටියේ භූ රූප ලක්ෂණ නිසා මිනිසුන් තුළ ඇතිවූ ඇදහිලි හා විශ්වාසයන් ද මෙහි සංස්කෘතික භූ දර්ශනය සකස්වීමෙහිලා බලපෑ බව හඳුනාගත හැකිය. මේ අනුව රිටිගල සංස්කෘතික භූ දර්ශනය කාලයක් තුළ ස්වාභාවික භූ දර්ශනයෙහි මානව ක්‍රියාකාරීත්වය නිසා නිර්මාණය වූවක් බව හඳුනාගත හැකිය.

**ප්‍රමුඛ පද :** රිටිගල, සංස්කෘතික භූ දර්ශනය, මානව ක්‍රියාකාරීත්වය, ස්වාභාවික භූ දර්ශනය,

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
chanakamadhumaladhipaththu@gmail.com